# <u>ඔටිසම්, නැමති ළදරු සංවර්ධන අක්‍රමිකතාවය හදුනා ගැනීමේ සංශෝධිත ප්‍රශ්ණ මාලාව</u>

ඔබේ දරුවා සාමාන්‍යයෙන් කුමන ආකාරයේ දරුවෙකුද යන්න පිලිබඳව පහත දැක්වෙන ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන්න. සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සැපයිමට උත්සහ කරන්න. දරුවාගේ හැසිරීම කලාතුරකින් සිදුවන්නේ නම් (උදා:- එම හැසිරීම වරක් හෝ දෙවරක් දැක ඇත්නම්) එබඳු හැසිරීමක් නැතැයි පිලිතුරු සපයන්න. ප්‍රශ්න අංක 5,6,7,9 සහ 20 යම් අවස්ථාවක එම හැසිරීම දැක තිබේ **නම්** , ඒ බව සඳහන් කරන්න.

01. ඔබේ දරුවා දණහිස මත තබා උඩ දැම්ම පැද්දීම වැනි ක්‍රියා වලදි සතුටු වෙනවාද? **ඔව්/නැත**

02. ඔබේ දරුවා අනිත් ළමයින් පිළිබඳව උනන්දුවක් දක්වනවාද? **ඔව්/නැත**

03. ඔබේ දරුවා තරප්පු පඩි වැනි දේවල් මත නැගිමට ප්‍රිය කරනවාද? **ඔව්/නැත**

04. ඔබේ දරුවා මුහුණ වසාගෙන සිට නැවත නිරාවරණය කර සතුටු වෙනවාද? **ඔව්/නැත**

05. ඔබේ දරුවා යම් අවස්ථාවක ඔබ කරන ක්‍රියා මවාපෑම (ඇගවීම) කර තිබේද?

(උදා :- ඔබ ටෙලිපෝනයෙන් කථාකරන ආකාරය හො ඔබ වෙනත් දරුවෙකුට සලකන ආකාරයට ඔබේ දරුවා බෝනික්කෙකුට සලකා තිබේද?) **ඔව්/නැත**

06. ඔබේ දරුවා යම් අවස්ථාවක දෙවන (දබර) ඇගිල්ල දිගුකර පෙන්වා යමක් ඉල්ලා තිබේද? **ඔව්/නැත**

07. ඔබේ දරුවා යම් අවස්ථාවක දෙවන (දබර ඇගිල්ල) දිගු ර පෙන්වා යම් දෙයක් කෙරෙහි ඇති කැමැත්ත ප්‍රකාශ කර තිබේද? **ඔව්/නැත**

08. ඔබේ දරුවා කුඩා සෙල්ලම් බඩු නිකරුනේ කට ගෑම, අතගෑම හෝ බිම දැම්ම වැනි දේ වලින් තොරව එවාට ගැලපෙන පරිදි සෙල්ලම් කරනවාද? **ඔව්/නැත**

09. ඔබේ දරුවා යම් අවස්ථාවක කිසියම් දෙයක් ඔබට පෙන්වීම සඳහා ඔබවෙත ගෙනවිත් තිබේද? **ඔව්/නැත**

10. ඔබේ දරුවා තත්පරයක් හෝ දෙකකට වැඩි කාලයක් ඔබේ ඇස් දෙස බලා සිටිනවාද? **ඔව්/නැත**

11. ඔබේ දරුවා ශබ්ද වලට අධිසංවේදිතාවයක් දක්වන්නේද? **ඔව්/නැත**

12. ඔබේ දරුවා ඔබේ සිනහවට ප්‍රතිචාරාත්මකව සිනාසෙන්නේද? **ඔව්/නැත**

13. ඔබේ දරුවා ඔබව අනුකරනය කරනවාද?

(ඔබ මුහුනින් යම් ඉරියව්වක් පෙන්වූ විට එය අනුකරනය කරනවාද උදා:- දිව දිගුකිරීම, ඇස් වසා ගැනීම) **ඔව්/නැත**

14. ඔබේ දරුවා ඔහුගේ / ඇයගේ ඔබ අමතන නමට ප්‍රතිචාරයක් දක්වයිද? **ඔව්/නැත**

15. කාමරයක කෙලවරක සිට ඔබේ දරුවාට අනෙක් කෙලවරෙහි තිබෙන සෙල්ලම් භාණ්ඩයක් පෙන්වූ විට ඒ දෙස බලනවාද? **ඔව්/නැත**

16. ඔබගේ දරුවා ඇවිදිනවාද? **ඔව්/නැත**

17. ඔබගේ දරුවා ඔබ බලා සිටින දේවල් දෙස බලනවාද? **ඔව්/නැත**

18. ඔබගේ දරුවා ඔහුගේ හෝ ඇයගේ මුහුණ ඉදිරියේ අසාමාන්‍ය ලෙස ඇඟිලි චලනය කරනවාද? **ඔව්/නැත**

19. ඔබගේ දරුවා ඔබගේ අවධානය ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරකම් වලට ගැනීමට උත්සහ කරනවාද? **ඔව්/නැත**

20. ඔබේ දරුවාට කන් ඇසීමේ දුර්වලතාවයක් ඇතැයි යම් අවස්ථාවක සිතා තිබේද? **ඔව්/නැත**

21. ඔබේ දරුවා අනෙක් අය කථා කරන දේ තේරුම් ගැනීමේ හැකියාවක් තිබේද? **ඔව්/නැත**

22. ඔබේ දරුවා අරමුනක් නොමැතිව යම් යෙක් දෙස නිකරුනේ බලා සිටින අවස්ථා තිබේද? **ඔව්/නැත**

23. ඔබේ දරුවා නුපුරුදු යම් දෙයක් හමු වූ විට ඔබගේ ප්‍රතිචාරය දැනගැනීමට ඔබගේ මුහුණ දෙස බලනවාද? **ඔව්/නැත**

මෙම ප්‍රශ්ණමාලාව ඔබ වෙත යොමු කිරීම සම්බන්ධයෙන් ඔබගේ අදහස් ප්‍රකාශ කරන්න.

.................................................................................................

..........................................................................................